**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.1 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

(අ) ප්‍රමිත 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සඳහා ඉදිරිපත් කර ඇති උපලේඛන වල සංඛ්‍යාත්මක තොරතුරු සංසදනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත 16 ප්‍රකාරව සේවක විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සම්පූර්ණයෙන්ම ක්ෂයකර වටිනාකම ශුන්‍ය වී තිබූ එහෙත් ප්‍රයෝජනයට ගනු ලබන යන්ත්‍ර පිරියත හා උපකරණ ප්‍රමිත 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

රු.140,450 ක් පිරිවැය වූ හා සමුච්චිත ක්ෂය රු.99,350 ක් වන වත්කම් අපහරණය කිරීමේදී වත්කමේ පිරිවැය හා සමුච්චිත ක්ෂය ලෙස රු.80,000 බැගින් වත්කම් ඉවත්කිරීමේ ගිණුමට මාරු කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.41,100 කින් අඩුවෙන් දැක්වුණි.

## 1:2:3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රජයේ මුදල් රෙගුලාසි මු. රෙ. 371 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව සුළු මුදල් අතුරු අග්‍රිම උපරිම සීමාව ඉක්මවා කොමිෂන් සභාව විසින් එකම නිලධාරියෙකු වෙත අවස්ථා 03 කදී එකතුව රු.17,500 ක මුදලක් ලබා දී තිබුණි. |
| (ආ) | 2008 මැයි 28 දිනැති හා අංක 428 දරන රාජ්‍ය මුදල් චක්‍රලෙඛය | චක්‍රලේඛයට පටහැනිව අවස්ථා 110 කදී රු.1,020 ත් රු.6,325 ත් අතර පරාසයක වන එකතුව රු.230,016 ක සුළු මුදලින් ගෙවීම් සිදු කර තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:3 වගන්තිය | පාලක මණ්ඩලය අනුමත කරන ලද සංයුක්ත සැලස්මේ පිටපත් වාර්ෂික අයවැය ලේඛනය සමඟ නියමිත දිනට අදාල පාර්ශව වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති හා අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම හා වාහන ධාවනයේ මාසික සාරාංශ වාර්තා ලොග් සටහන් පොතේ සටහන් කිරීම සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.1,556,368 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.428,072 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,128,296 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වැටුප් හා වේතන රු.211,178 කින්ද ගමන් වියදම් රු.128,505 කින්ද වත්කම් අලුත්වැඩියා හා නඩත්තු වියදම් රු.194,620 කින්ද උපයෝගිතා හා වෙනත් සේවා රු.253,857 කින්ද භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වියදම් රු.724,005 කින්ද අඩුවීම හා පොත් මුද්‍රණය සඳහා රු.456,500 ක පරිත්‍යාග ලැබීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 6 (ඇ) ප්‍රකාරව කොමිෂන් සභාවේ මෙහෙයවීමෙන් හා ලැබෙන පැමිණිලි වලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා ප්‍රතිකර්ම යෙදීම කොමිෂන් සභාවේ අරමුණක් වුවත් කොමිෂන් සභාව විසින් 2010 නොවැම්බර් මාසය වන විටත් සිය මෙහෙයවීමෙන් පැමිණිලි කිසිවක් වාර්තා කරගෙන නොතිබුණි.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි භාෂා අයිතිය කඩවීම සම්බන්ධයෙන් ලැබෙන සෑම පැමිණිල්ලක්ම රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතට අනුව විභාග කළයුතු අතර එම පනතේ 23(4) ප්‍රකාරව පැමිණිල්ලේ දින සිට දින 120 ක් ඇතුලත අවසාන වාර්තාව ඉදිරිපත් කළයුතුය. එසේවුවත් පැමිණිලි 07 සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඇ) දීප ව්‍යාප්තව භාෂා විගණන වැඩ සටහන් 28 ක් පැවැත්වීමට ද ,රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් භාවය වැඩිකිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 35 ක්

පැවැත්වීමට ද, රු.1,000,000 පතිපාදන වෙන්කර තිබුන අතර කිසිදු වැඩසටහනක් 2010 වර්ෂය තුළදී පවත්වා නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේදි දෙමළ භාෂා පංති පැවැත්වීම සඳහා නාවික හමුදාව විසින් ලබාදුන් මුදලින් භාෂා පංති නොපවත්වා රු.238,757 ක් තැන්පත් ගිණුම යටතේ දක්වා තිබුණි.

### 2.2.2 ප්‍රමාද වු ව්‍යාපෘති

සංවාද වැකි අත්පොත් 3 ක් පිළියෙළ කිරීම සඳහා කමිටු රැස්වීම් වෙනුවෙන් 2004 වර්ෂයේ සිට 2007 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා එකතුව රු. 322,514 ක් වූ ගෙවීම් කර තිබුණ අතර එම අත් පොත් තුනෙන් , රු. 100,000 ක් වැයකර බාහිර පාර්ශවයක් වෙතින් සංස්කරණය කොට 2006 දෙසැම්බර් 08 දින ලබාදී ඇති රාජ්‍ය නිලධාරින් සඳහා වන අත්පොත හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්පොත 2011 මාර්තු 31 වන විටත් මුද්‍රණය කර නොතිබුණි.

### 2.2.3 මානව සම්පත් කළමනාකරණය

අනුමත තනතුරු 28 න් 08 ක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුනි.

### 2.2.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ආයතනය තුල නොමැති අතර අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු සඳහා සහභාගිවේ.

### 2.2.5 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණ අතර අයවැයගත වියදම් හා තත්‍ය වියදම සැසදීමේදී විෂයයන් 06 ක් සම්බන්ධයෙන් 48% සිට 633% දක්වා වූ පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වූහෙයින් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) කාර්ය සාධනය